චක්‍රලේඛ අංක : 07 /2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.10. 25

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>බස්නාහිර පළාත් සමූපකාර සේවයේ විධායක තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධව</u>

සමූපකාර ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමේදී ඊට අදාල සම්මුඛ පරීක්ෂණ වලදී අයදුම්කරුවන් විසින් සාවද්‍ය සහතික ඉදිරිපත් කර සුදුසුකම් තහවුරු කරන බවට කොමිෂන් සභාවට තොරතුරු අනාවරණය වී ඇත.

02. එම තත්වය හේතුකොට ගෙන විධායක මට්ටමේ තනතුරු සඳහා කොමිෂන් සභා අනුමැතියට ඉදිරිපත් කිරීමේදී කොමිෂන් සභාව විසින් තාවකාලික පූර්ව අනුමැතියක් ලබා දීමට කටයුතු කරනු ඇත. ඒ අනුව අදාල සමිතිය විසින් ද සේවකයා වෙත ලබා දිය යුතු වන්නේ තාවකාලික පත්වීමකි.

03. තවද, මෙවැනි සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වී, බඳවා ගැනීමට සුදුසුකම් ලබන අයදුම්කරුවකුගේ මූලික සුදුසුකම් හා ලකුණු රැස්කර ගනු ලැබූ අනෙකුත් සහතික පත්‍ර වල නිරවද්‍යතාවය කොමිෂන් සභාව විසින් තහවුරු කර ගැනීමෙන් පසු කොමිෂන් සභාවේ අවසන් අනුමැතිය දීමට කටයුතු කරනු ඇත. එසේම ඉදිරිපත් කර ඇති එක් සහතිකයක් හෝ ව්‍යාජ බවට තහවුරු වුවහොත් පත්වීම අවලංගු වනු ඇත.එවන් අවස්ථාවන්හීදී සම්මුඛ පරීක්ෂණයේදී ඊලඟට සුදුසුකම්ලත් අයදුම්කරු පත්කිරීම සම්බන්ධයෙන් සමිතිය විසින් කටයුතු කල යුතුවේ.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ.
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.